# රංජිත් වික්‍රමසිංහ සම්මාන ලබයි



එෆ් එම් 97.7 ඔස්සේ වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලියෙන් පුරා වසර විසි පහක් අප හමුවට එන රංජිත් වික්‍රමසිංහ පසුගිය දා ඕස්ට්‍රේලියානු බහුසංස්කෘතික සම්මානයෙන් පුද ලැබුවේ ය.

සිය බිරිඳ වන රූබි වික්‍රමසිංහ සමගින් වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලියෙන් සෑම ඉරිදාවකම රාත්‍රි 8 ට රංජිත් අප හමුවට එයි. වසරක් දෙකක් නොව වසර විසි පහක්ම ඔහු මේ දුෂ්කර කාර්යයේ නිරතව සිටින්නේ කිසිදු මැසිවිල්ලක් නැතිවය. මෙය ගිනස් වාර්තා පොතට යා යුතු තරමේ වාර්තාවකි.

වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලිය ශ්‍රාවකයින් අතර ජනප්‍රිය ය. එය රසවත්ය. සරළ ය. අපට සොයා ගත නොහැකි පැරණි ගී මෙන්ම නූතන ගීතද ඔහු එක සේ සිය ශ්‍රාවකයනට අසන්නට සළස්වයි.

"ගුණදාස කපුගේ මහත්තයා අන්තිමට සංගීතවත් කළ ගීතයත් මා ළඟ තියෙනවා" වරක් රංජිත් අපට කීවේ ය. කීවා පමණක් නොව මෙතෙක් කිසිවකුට අසන්නට නොලැබුණ ඒ සංගීතය අපට අසන්නටද සැළැස්සුවේය. රංජිත් ගේ වැඩ එසේය. ඔහු සංගීතය සොයා ශ්‍රී ලංකාව පුරා ඇවිදියි. ඒ ඒවා සිය ශ්‍රාවකයන් හා බෙදා හදා ගන්නටය. ඔහු සතු ගීත එකතුව තරම් ගීත එකතුවක් කිසිදු ශ්‍රී ලාංකිකයකු සතුව නැතැයි අපට සිතෙන තරම් එය විශාලය.

මේසා විශාල සේවාවක් ශ්‍රී ලාංකික ජනතාව වෙත ඉටු කරන රංජිත් වික්‍රමසිංහ මෙසේ සම්මානයෙන් පුද ලැබීම අපටද සතුටකි.

"මේ සම්මානය ලැබීමේ සතුට මගේ ශ්‍රාවකයන් සමග බෙදා ගන්න මං කැමතියි" රංජිත් කියයි ".. ඒ එක්කම මා සමග අවුරුදු විසි පහක් මේ වැඩ සටහන කරන මගේ බිරිඳ රූබිත් ආදරයෙන් මතක් කරන්න ඕනෙ.. මගේ පුතාලාගෙන් ලැබෙන සහයත් හරිම වටිනවා"

වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලිය වසර විසිපහක් පවත්වාගෙන යන්නට තමාට සහය දුන් සියලු දෙනාටම තමාගේ ස්තුතිය පුද කරන බව රංජිත් සන්නස සමග පැවසුවේ ය.

ඔහුට අපේ සුබ පැතුම්.

ශ්‍රීනාත් මද්දුමගේ




## ඉඩමක් විකිණීමට ඇත

විජේරාම ගංගොඩවිල හයිලෙවල් පාරට නුදුරුව
පර්චස් 20ක ඉඩම විකිණීමට ඇත

දුම්රියට බස් නැවතුම්පලට බැංකු සහ
ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට 1 Km අඩු දුර
ඉඩමේ නිවාස තුනක් ඇත
විශ්ව විද්‍යල සිසුනට කාමර කුළියට දී මසකට රුපියල් 75000
කට වඩා වැඩි ආදායමක් ලැබිය හැකිය
පදිංචියට සුදුසු අගනා පරිසරය
ඉතා කදිම ආයෝජන අවස්ථාවකි

**අමතන්න**
**ඉන්දික 0011 94 783 926715**
**ප්‍රියන්ත 0433 564 387**




